ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය පිළිබඳව
පෞද්ගලික අංශයේ හැකියාවන් වැඩි දියුණු කිරීම

# ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරන පද්ධතිය



DMC SRI LANKA

WFP World Food Programme

The Ceylon Chamber of Commerce

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| 1. | අන්තර්ගතය | 01 |
| 2. | කෙටි යෙදුම් | 02 |
| 3. | පසුබිම | 07 |
| 4. | ඉගෙනීමේ අරමුණු | 08 |
| 5. | ලියාපදිංචි විය යුත්තේ කවුද? | 09 |
| 6. | පාඨමාලා අන්තර්ගතය | 09 |
| 7. | උපදේශන ක්‍රමවේදය | 10 |
| 8. | ද්‍රව්‍ය සහ සම්පත | 10 |
| 9. | ඉගෙනුම් ක්‍රියාකාරකම් | 12 |
| 10. | තක්සේරුව, ඇගයීම සහ සහතික කිරීම | 12 |
| 11. | පාඨමාලා කාලසටහන | 13 |

# කෙටි යෙදුම්

වයාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය

| | |
|---|---|
| BCP | ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම |
| CCC | ලංකා වාණිජ මණ්ඩලය |
| CEFENET | ව්‍යවසාය ජාලය ගොඩනැගීම තුළින් නිපුණතා පාදක ආර්ථිකයන් |
| DMC | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| ICT | තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| ISBN | බුද්ධිමත් වියදම් ව්‍යාපාර ජාලය (Intelligent spend & Business Network) |
| ISO | ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය |
| NEDA | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය |
| PA | ප්‍රමුඛතා ක්‍රියාකාරකම් |
| PDCA | සැලසුම් කරන්න - ක්‍රියාත්මක කරන්න-පරික්ෂා කරන්න-වැඩි දියුණු කරන්න |
| Q&A | ප්‍රශ්න සහ පිළිතුරු |
| RTO | ප්‍රතිසාධන කාල අරමුණ |
| SIYB | 'ඔබේ ව්‍යාපාරය ආරම්භ කර වැඩිදියුණු කරන්න' සංගමය |
| SME | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් |
| TOT | පුහුණුකරුවන් පුහුණු කිරීම |
| WFP | ලෝක ආහාර වැඩසටහ |

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ පණිවුඩය



ලෝක ආහාර වැඩසටහනේ (WFP) මූල්‍ය අනුග්‍රහයෙන්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ ලංකා වාණිජ මණ්ඩලයේ තාක්ෂණික සහාය ද ඇතිව සංවර්ධනය වන ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS) අත්පොත සහ විෂයමාලාව තහවුරු කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

මෙම මුලපිරීම, ආපදා අවස්ථාවන්හිදී ව්‍යාපාර මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි වන පරිදි, ශ්‍රී ලාංකික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ (SME) ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා තැබූ ඉතා වැදගත් පියවරකි.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අපේ රටේ ආර්ථිකයට අත්‍යවශ්‍ය වන නමුත් ස්වාභාවික විපත්, ආර්ථික කම්පන සහ වෙනත් අනපේක්ෂිත අභියෝග නිසා ඇතිවන බාධාවන්ට ඔවුන් බෙහෙවින් ගොදුරු වේ. ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති රාමුවක් යටතේ ප්‍රායෝගික අත්පොතක් සහ විෂයමාලාවක් නිර්මාණය කිරීම මඟින් අවදානම් අවම කිරීම, ජීවනෝපායන් ආරක්ෂා කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග, මෙවලම් සහ පෙර සූදානම් වීමේ ක්‍රියාමාර්ගයන්ගෙන් ව්‍යාපාර සන්නද්ධ කරනු ඇත.

මෙම තීරණාත්මක ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම මෙහෙයවීමේදී ලෝක ආහාර වැඩසටහන, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ලංකා වාණිජ මණ්ඩලය දරන සහයෝගී උත්සාහයන් කර්මාන්ත අමාත්‍යාංශයේ පැසසුමට ලක් වේ. BCMS අත්පොත සහ විෂයමාලාව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා අගනා සම්පතක් වනු ඇති බවත්, ඔවුන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට සහ වඩාත් ස්ථාවර හා තිරසාර ආර්ථික පරිසරයකට දායක වීමට උපකාරී වන බවත් අපි විශ්වාස කරමු.

ජේ එම් තිලකා ජයසුන්දර
ලේකම්
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ පණිවුඩය



ලෝක ආහාර වැඩසටහනේ (WFP) මූල්‍ය අනුග්‍රහයෙන් සහ ලංකා වාණිජ මණ්ඩලයේ තාක්ෂණික සහයෙන් සිදුවන මුලපිරීමක් වන ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති (BCMS) විෂයමාලාව සහ අත්පොත සංවර්ධනය කිරීම සඳහා මගේ සහයෝගය ලබා දීමට හැකිවීම ගැන මම මහත් අගය කොට සලකමි.

ස්වාභාවික හෝ මිනිසා විසින් ඇති කරන ලද ආපදා - ආර්ථික ක්‍රියාකාරකම් සහ ඒවා පවත්වාගෙන යන ජීවනෝපායන් සඳහා සැලකිය යුතු බලපෑමක් එල්ල කරයි. විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) බොහෝ විට බාධාවන්ට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත. ව්‍යාපාර සාධනීය ලෙස ප්‍රතිචාර දැක්වීමට සහ එවැනි සිදුවීම් වලින් ඉක්මනින් යථා තත්ත්වයට පත්වීමට සූදානම් බව සහතික කිරීම සඳහා ව්‍යුහගත ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ.

පෞද්ගලික අංශය තුළ පෙර සූදානම සහ ඔරොත්තු දීමේ සංස්කෘතියක් ගොඩනැගීමෙහිලා මෙම මුලපිරීමේ වැදගත්කම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හඳුනාගෙන ඇත. ව්‍යාපාර, ප්‍රායෝගික මෙවලම්, දැනුම සහ අඛණ්ඩතා උපාය මාර්ග වලින් සන්නද්ධ කිරීමෙන්, BCP විෂයමාලාව සහ අත්පොත තනි ව්‍යවසායන් ආරක්ෂා කරනවා පමණක් නොව, ජාතියේ සමස්ත සමාජ-ආර්ථික ව්‍යුහය ශක්තිමත් කරනු ඇත.

සම්බන්ධ වන සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගී උත්සාහයන් අපි අගය කරන අතරම, සියලු අංශ පුරා ආපදා අවදානම් අවම කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරන වැඩසටහන් සඳහා සහාය වීම සඳහා අපගේ කැපවීම නැවත තහවුරු කරමු.

මේජර් ජෙනරාල් සම්පත් කොටුවේගොඩ (විශ්‍රාමික) ndc IG
අධ්‍යක්ෂ ජෙනරාල්
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## ශ්‍රී ලංකා නියෝජිතයාගේ පණිවිඩය (වැඩ බලන) එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ, එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහනේ (UN WFP) සහ ලංකා වාණිජ මණ්ඩලයේ සහයෝගිතාවයේ සන්ධිස්ථානයක් වන ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS) අත්පොත සහ විෂයමාලාව මා ඔබට ඉදිරිපත් කරන්නේ මහත් ආඩම්බරයකිනි.

ජීවිත සුරැකීමේ සහ වෙනස් කිරීමේ වගකීමක් ඇති සංවිධානයක් ලෙස, අර්බුදකාරී කාලවලදී ප්‍රජාවන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා පෞද්ගලික අංශයේ තීරණාත්මක කාර්යභාරය අපි හඳුනා ගනිමු. ස්වාභාවික විපත්, හදිසි මහජන සෞඛ්‍ය තත්ත්වයන්  හෝ මෙහෙයුම් බාධාවන්ට මුහුණ දීමේදී, ව්‍යාපාරවලට අඛණ්ඩව ක්‍රියාකාරී වීමට ඇති හැකියාව සහ ඔරොත්තු දීමේ හැකියාව, වඩාත් අවදානමට ලක්විය හැකි ජනගහනය ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

මෙම අත්පොත සහ විෂය මාලාව පෞද්ගලික අංශයේ ආයතනවලට අනපේක්ෂිත සිදුවීම් සහ අභියෝග සඳහා සූදානම් වීමට, ප්‍රතිචාර දැක්වීමට සහ ඒවායින් යථා තත්ත්වයට පත්වීම සඳහා මඟ පෙන්වීමට, ප්‍රායෝගික මෙන්ම උපායමාර්ගික රාමුවක් සපයන අතර අත්‍යවශ්‍ය සේවාවන් වඩාත් අවශ්‍ය වූ විට අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරයි.

මෙම අත්පොත, අභියෝග හමුවේ පවා සංවිධානවල සමෘද්ධිමත් වීම බලගන්වමින්, ඔරොත්තු දිය හැකි ශක්තිමත් ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති ගොඩනැගීම උත්ප්‍රේරණය කරනු ඇතැයි අපි විශ්වාස කරමු.

රොබට් ඔලිවර්
ශ්‍රී ලංකා නියෝජිත(වැඩ බලන)
ලෝක ආහාර වැඩසටහන, ශ්‍රී ලංකාව

## ලංකා වාණිජ මණ්ඩලයේ මහලේකම් සහ ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි (SMEs) ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ලෝක ආහාර වැඩසටහනේ (WFP) මූල්‍ය අනුග්‍රහයෙන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) සහාය ද ඇතිව සංවර්ධනය වූ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති (BCMS) අත්පොත සහ විෂයමාලාවට නායකත්වය ලබා දීම ගැන ලංකා වාණිජ මණ්ඩලය ආඩම්බර වේ.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අපගේ ආර්ථිකයේ කොඳු නාරටිය වන නමුත්, ආපදාවන් සහ බාධාවන් වල දී ඔවුන් බෙහෙවින් ගොදුරු වීමේ අවදානමට ලක් වේ. මෙහෙයුම් පවත්වා ගැනීමට, අවදානම් අපේක්ෂා කිරීමට සහ අහිතකර සිදුවීම් වලින් ඉක්මනින් යථා තත්ත්වයට පත්වීමට අවශ්‍ය මෙවලම්, දැනුම සහ රාමු වලින් ව්‍යාපාර සන්නද්ධ කිරීම සඳහා මෙම අත්පොත සහ විෂයමාලාව සංවර්ධනය කිරීම තීරණාත්මක පියවරකි.

මෙම මුලපිරීම හරහා, අවදානම් කළමනාකරණයේ සහ ආපදා පෙර සූදානමේ හොඳම භාවිතයන්ගෙන් පෞද්ගලික අංශය සවිබල ගැන්වීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය සිය කැපවීම නැවත තහවුරු කරයි.හොඳින් සූදානම් වූ ව්‍යාපාරික ප්‍රජාවක් ආර්ථික ස්ථාවරත්වයට පමණක් නොව, අපේ ජාතියේ සමස්ථ ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාරභාවයට ද දායක වන බව අපි විශ්වාස කරමු.

මෙය යථාර්ථයක් බවට පත් කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් ලෝක ආහාර වැඩසටහන ඇතුළු සියලුම පාර්ශවකරුවන්ට අපගේ අවංක කෘතඥතාව පළ කරමු.

බුවනෙකබාහු පෙරේරා
මහලේකම් සහ ප්‍රධාන විධායක නිලධාරී
ලංකා වාණිජ මණ්ඩලය

## ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය පුහුණුකරුවන් පුහුණු කිරීමේ විෂය මාලාව

### 1.පසුබිම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) බොහෝ විට ස්වාභාවික විපත්, සැපයුම් දාම බාධා වීම් හෝ සීමිත සම්පත් හේතුවෙන් ආර්ථික පසුබෑම් වැනි අනපේක්ෂිත සිදුවීම් වලට ගොදුරු වේ.මෙම බාධා වීම් දරුණු මූල්‍ය ප්‍රතිවිපාක ඇති කළ හැකි අතර, ව්‍යාපාර වසා දැමීමට ද හේතු විය හැක. එපමණක් නොව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පාරිභෝගික පක්ෂපාතිත්වය සහ විශ්වාසය මත දැඩි ලෙස රඳා පවතින බැවින්, අර්බුදකාරී කාලවලදී මෙහෙයුම් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට තීරණාත්මක කාර්යයන් ආරක්ෂා කර ගැනීමට, අක්‍රීය කාලය අවම කිරීමට සහ මූල්‍ය පාඩු අවම කිරීමට හැකි වන අතර එමඟින් වේගවත් ප්‍රතිසාධනයකට ඉඩ සැලසේ. ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය මඟින් අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට ව්‍යාපාර සූදානම් කරන අතර එමඟින් උපායමාර්ගික වර්ධනය කෙරෙහි විශ්වාසයෙන් අවධානය යොමු කිරීමට ඔවුන්ට හැකි වේ. ඊට අමතරව, අභියෝගාත්මක කාලවලදී පවා ගනුදෙනුකරුවන්ට, හවුල්කරුවන්ට සහ පාර්ශවකරුවන්ට ඔවුන්ගේ විශ්වසනීයත්වය සහතික කරයි.

ඇතැම් කර්මාන්තවල, නියාමන හෝ ගිවිසුම්ගත අවශ්‍යතා සපුරාලීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති රාමුවක් ද අත්‍යවශ්‍ය වන අතර, එමගින් අනුකූලතාව සහ තරඟකාරිත්වය සහතික කරයි. හොඳින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියක් මඟින් හදිසි අවස්ථා වලදී ඵලදායී තීරණ ගැනීම පහසු කරමින් පැහැදිලි ක්‍රියා පටිපාටි සහ භූමිකාවන් ස්ථාපිත කරයි. තව ද, ශක්තිමත් උපාය මාර්ගික ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියක් සහිත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට, ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කිරීමෙන් තරඟකාරී වාසියක් ලබා ගත හැකි අතර එමඟින් ආයෝජකයින්, සේවාදායකයින් සහ සහයෝගිතාකරුවන් සඳහා ඔවුන් වඩාත් ආකර්ශනීය වේ.

ආපදා කළමනාකරණය, ආපදා අවදානම් අවම කිරීම සහ දේශගුණික සේවා සඳහා පෞද්ගලික අංශයේ තීරණාත්මක කාර්යභාරය හඳුනා ගැනීම, සේවා සපයන්නන් හරහා ඔවුන්ගේ ධාරිතාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම ප්‍රවේශය පුද්ගලික අංශයේ සමාගම්වලට අවදානම් සංවේදී සැලසුම්කරණය අනුගමනය කිරීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති රාමු සංවර්ධනය කිරීමට හෝ යාවත්කාලීන කිරීමට හැකියාව ලබා දෙයි.

ලෝක ආහාර වැඩසටහන (WFP) විසින් ලංකා වාණිජ මණ්ඩලයේ (CCC) සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ (DMC) තාක්ෂණික සහාය ඇතිව, ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය පිළිබඳ පෞද්ගලික අංශයේ හැකියාවන් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති (BCMS) පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) පාඨමාලාව 2025 දී සංවර්ධනය වෙමින් පවතී. මෙම පාඨමාලාවේ අරමුණ වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය පිළිබඳ විශේෂඥතාවෙන් පෞද්ගලික සහ රජයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ පුහුණුකරුවන් සන්නද්ධ කිරීමයි.

පාඨමාලා අන්තර්ගතය විශේෂයෙන් කෘෂිකර්මය, ඇඟලුම්, ධීවර, වැවිලි සහ සංචාරක අංශ සඳහා සකස් කර ඇත. මෙම පාඨමාලාව මොණරාගල, ත්‍රිකුණාමලය, වවුනියාව, කුරුණෑගල සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල නියමු පාඨමාලාවක් ලෙස ක්‍රියාත්මක කරන ලද අතර, ශ්‍රී ලංකාවේ ඌව, නැගෙනහිර, උතුරු,

ඊසානදිග සහ මධ්‍යම පළාත් ආවරණය වන පරිදි පවත්වන ලදී. මෙම පාඨමාලාව සංවර්ධනය කිරීමේ දී රටේ ප්‍රමුඛතම ආපදා අවදානම් කළමනාකරණය අධිකාරිය වන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ පුළුල් ලෙස සාකච්ඡා කරන ලදි

අදාළ අමාත්‍යාංශ, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, ජාත්‍යන්තර/දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් මානුෂීය ක්‍රියාකාරීන්ගේ දායකත්වයෙන් පැවති වැඩමුළුවකදී මෙම පාඨමාලාව වලංගු කරන ලදී. අවසාන වශයෙන්, ව්‍යාපෘතියේ දක්වා ඇති සිදුවෙමින් පවතින ක්‍රියාත්මක කිරීම සහ අනාගත අඛණ්ඩ පැවැත්ම සඳහා DMC විසින් පාඨමාලාව අනුමත කරන ලදී.

## 2.ඉගෙනීමේ අරමුණු

ශ්‍රී ලංකාව විවිධ භූ භෞතික, ජල විද්‍යාත්මක, දේශගුණික සහ කාලගුණ විද්‍යාත්මක උපද්‍රව හේතුවෙන් ඇතිවන ස්වාභාවික විපත් වලට ගොදුරු වීමේ අවදානම බෙහෙවින් වැඩි ය. නායයෑම්, ගංවතුර, කුණාටු, නියඟ, සමුද්‍රීය සිදුවීම් ආදිය නිතර දක්නට ලැබේ. මෙම ව්‍යසන හේතුවෙන් පෞද්ගලික අංශයට විශාල හානියක් හා පාඩු සිදු වන අතර, කෙටි කාලීනව සහ දිගු කාලීනව දේශීය හා ජාතික සමාජ-ආර්ථික ස්ථාවරත්වයට බාධා ඇති වේ.

මෙම සන්දර්භය තුළ, ආපදා ආශ්‍රිත කම්පන සහ ආතතීන් අපේක්ෂා කිරීමට, සූදානම් වීමට සහ ඒවාට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට පෞද්ගලික අංශයේ ධාරිතාව වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. ආපදා අවදානම් අවම කිරීම සහ කළමනාකරණය කිරීමේදී පෞද්ගලික අංශය ශක්තිමත් කිරීමෙහිලා, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස පිළිගෙන තිබේ. ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය පිළිබඳ උසස් දැනුමෙන් සහ ප්‍රායෝගික කුසලතාවන්ගෙන් පෞද්ගලික සහ රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සන්නද්ධ කිරීමෙන්, වඩාත් ඔරොත්තු දෙන ව්‍යාපාරික පරිසර පද්ධති පෝෂණය කළ හැකි අතර, අනාගත බාධාවන්ගෙන් වැඩි ස්ථාවරත්වයක් සහ වේගවත් ප්‍රතිසාධනයක් සහතික කෙරේ.

මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු, සහභාගීවන්නන්ට:

- ISO 22301 සහ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිවල හොඳම භාවිතයන් ඇතුළුව ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියහි මූලධර්ම සහ රාමු තේරුම් ගැනීමට හැකි වේ.
- විවිධ කර්මාන්ත සහ ආයතනික අවශ්‍යතාවලට අනුකූලව ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට හැකි වේ.
- පූර්ව ක්‍රියාකාරී අවදානම් කළමනාකරණ උපාය මාර්ග සහතික කරමින් ව්‍යාපාර මෙහෙයුම්වලට බලපෑම් කළ හැකි අවදානම් හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ අවම කිරීමට හැකි වේ.
- බාධා ඵලදායී ලෙස හැසිරවීමට, අවම මෙහෙයුම් අක්‍රිය කාලය සහතික කිරීමට සහ විශේෂයෙන් වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල ආරක්ෂාව සහතික කිරීමට අර්බුද කළමනාකරණය සහ හදිසි ප්‍රතිචාර උපාය මාර්ග යොදා ගැනීමට හැකි වේ.
- නිතිපතා පරීක්ෂණ, අභ්‍යාස සහ අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ පියවරයන් හරහා ව්‍යාපාර අඛණ්ඩතා ක්‍රියාවලීන් ඇගයීමට සහ වැඩිදියුණු කිරීමට හැකි වේ.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන්, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය ඔවුන්ගේ මෙහෙයුම්වලට ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යාපාර මෙහෙයවීමට පුහුණුකරුවන් හොඳින් සන්නද්ධ වනු ඇත. එමඟින් ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ ව්‍යසනයන් හමුවේ පවා තිරසාර ආර්ථික වර්ධනයක් සහතික කෙරේ.

## 3. ලියාපදිංචි විය යුත්තේ කවුද?

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියෙහි පුහුණුකරුවන් පුහුණුකිරීමේ පාඨමාලාව විශේෂයෙන් නිර්මාණය කර ඇත්තේ පුද්ගලික සහ රජයේ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සඳහා මෙන්ම, එවැනි සංවිධාන සමඟ අනුබද්ධ පුහුණුකරුවන් සඳහා ය. එනම්:

- කුඩා ව්‍යවසාය අංශ
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
- 'ඔබේ ව්‍යාපාර ආරම්භ කර වැඩිදියුණු කරන්න' සංගමය (SIYB)
- බුද්ධිමත් වියදම් ව්‍යාපාර ජාලය (ISBN)
- ව්‍යවසාය ජාලය ගොඩනැගීම හරහා නිපුණතා පාදක ආර්ථිකයන් (CEFENET)
- පෞද්ගලික ව්‍යාපාරික සංගම් සහ වාණිජ මණ්ඩලවල නායකයින්

මෙම පාඨමාලාවට සහභාගිවන්නන් ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති පුහුණු මොඩියුලය ඔවුන්ගේ නිතිපතා පුහුණු වැඩසටහන් වලට ඒකාබද්ධ කිරීමට අපේක්ෂා කෙරේ. ඊට අමතරව, ව්‍යාපාර සමඟ උපදේශන කටයුතු වලදී ඔවුන් ලබාගත් දැනුම අදාළ කර ගන්නා අතර, බාධාවන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමට සහ මෙහෙයුම්වල අඛණ්ඩතාව සහතික කිරීමට උපකාරී වේ.

## 4. පාඨමාලා අන්තර්ගතය

මෙම පාඨමාලාව ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය හි සමස්ත වර්ණාවලියම ආවරණය කරන අතර, සහභාගිවන්නන්ට එහි සංකල්ප සහ රාමුව පිළිබඳ ව්‍යුහගත සහ පුළුල් අවබෝධයක් ලබා දෙයි. මෙම පුහුණුව තුළින්, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා ක්‍රමයෙන් ගොඩනඟා ගැනීමට සහභාගීවන්නන්ට හැකියාව ලැබෙන අතර, එමගින් සංවිධානවල ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු වේ.

මොඩියුලය 1: හැඳින්වීම

මොඩියුලය 2: ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය: කුමක් ද? සහ ඇයි?

මොඩියුලය 3: ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති රාමුව

මොඩියුලය 4: සංවිධානයේ සන්දර්භය

මොඩියුලය 5: නායකත්වය සහ කණ්ඩායම්

මොඩියුලය 6: ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය

මොඩියුලය 7: අවදානම් තක්සේරුව

මොඩියුලය 8: ව්‍යාපාර අඛණ්ඩතා උපායමාර්ග සහ විසඳුම්

මොඩියුලය 9: සම්පත් අවශ්‍යතා

මොඩියුලය 10: ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියෙහි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා අභ්‍යාස පැවැත්වීම

## 5. උපදේශන ක්‍රමවේදය

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව දින තුනක වැඩසටහනකි. ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම සඳහා ව්‍යුහගත, ක්‍රමානුකූල ප්‍රවේශයක් හරහා මූලික කුසලතා ගොඩනැගීම කෙරෙහි එය අවධානය යොමු කරන අතර, ව්‍යාපාර ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා පුළුල් උත්සාහයන්ට දායක වේ.

මෙම පාඨමාලාව ආකර්ශනීය සහ ඵලදායී ඉගෙනුම් අත්දැකීමක් නිර්මාණය කිරීම සඳහා අන්තර්ක්‍රියාකාරී ඉගැන්වීමේ ක්‍රමවේද භාවිතා කරයි. ප්‍රධාන උපදේශන ක්‍රමවලට ඇතුළත් වන්නේ:

- **නිපුණතා පාදක**: ප්‍රදර්ශනය කරන ලද කුසලතා සහ ප්‍රායෝගික යෙදීම් මත පදනම්ව ප්‍රගතිය නිරීක්ෂණය කර තක්සේරු කරනු ලැබේ.
- **ප්‍රායෝගික යෙදීම්**: පුහුණුව යථාර්ථවාදී අවස්ථා, සිද්ධි අධ්‍යයන සහ ප්‍රායෝගික අභ්‍යාස ඇතුළත් කරයි.
- **සහභාගීත්ව ප්‍රවේශය**: විවිධ පුහුණු වැඩසටහන් පුරා සහයෝගීතාව දිරිමත් කරන අතර අන්තර්ක්‍රියාකාරී ඉගෙනීම ප්‍රවර්ධනය කරන සාකච්ඡා සහ ප්‍රශ්නෝත්තර සැසි සඳහා අවස්ථා සමඟ ප්‍රායෝගිකව සම්බන්ධ වීම සඳහා නියැදි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රජාවන් ඇතුළත් වේ.
- **කාර්ය සාධනයට නැඹුරු**: කුසලතා සංවර්ධනය සඳහා පැහැදිලි, පියවරෙන් පියවර ප්‍රවේශයක් භාවිතා කර ක්‍රියාකාරී ප්‍රතිඵල සහතික කරයි.
- **ISO-සම්මත පෙළගැස්ම**: පාඨමාලා අන්තර්ගතය ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය සඳහා ISO ප්‍රමිතීන් අනුගමනය කරයි.
- සරල කළ රාමුව: ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පරිසර පද්ධතියේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා සකස් කර ඇත.

පුහුණුව ගුණාත්මකභාවය සහතික කරන අතර සහභාගිවන්නන්ට පාඨමාලාවෙන් ඉගෙන ගන්නා දැනුම අදාළ කර ගැනීමට හැකියාව ලබා දෙමින් සැබෑ ව්‍යවසායන් සඳහා ඔරොත්තු දෙන විසඳුම් ලබා දෙයි.

## 6. ද්‍රව්‍ය හා සම්පත්

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියෙහි පුහුණුකරුවන් පුහුණුකිරීමේ විෂය මාලාවට BCMS මූලධර්ම, ක්‍රමවේද සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග ඵලදායී ලෙස ඉගැන්වීම සඳහා පුහුණුකරුවන්ට දැනුම හා කුසලතා ලබා දීම සඳහා නිර්මාණය කර ඇති හොඳින් ව්‍යුහගත පාඨමාලා ද්‍රව්‍ය ඇතුළත් වේ. මෙම ද්‍රව්‍ය ඉංග්‍රීසි භාෂාවට අමතරව සිංහල සහ දෙමළ භාෂාවලින් ලබා ගත හැකිය. පුහුණු සම්පත් ලැයිස්තුව පහත දැක්වේ:

### සහභාගිවන්නන්ගේ අත්පොත

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියෙහි පුහුණුකරු පුහුණු වැඩසටහනේ සහභාගිවන්නන් සඳහා ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය සහභාගිවන්නාගේ අත්පොත ප්‍රධාන සම්පතකි. අත්පොත නිර්මාණය කර ඇත්තේ න්‍යායාත්මක අවබෝධය, ප්‍රායෝගික අභ්‍යාස සහ සිද්ධි පාදක පුහුණුව ලබා දෙන අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් සම්පතක් ලෙසය. එය උපදේශක මාර්ගෝපදේශයෙන් අනුපූරක වූ ව්‍යුහගත ඉගෙනුම් මාර්ගෝපදේශයක් ලෙස යොදා ගත හැක. අත්පොත ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය පිළිබඳ විශේෂඥතාව වර්ධනය කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඔරොත්තු

දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, ISO 22301:2019 ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම සහ අංශ-විශේෂිත අවශ්‍යතා සපුරාලීම කෙරෙහි අවධානය යොමු කරයි.

### උපදේශක මාර්ගෝපදේශය

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියෙහි පුහුණුකරුවන් පුහුණුකිරීමේ පාඨමාලාව සඳහා හොඳින් ගොඩනගා ඇති උපදේශක මාර්ගෝපදේශයක්, ඵලදායී හා බලපෑමක් ඇති කළ හැකි ඉගෙනුම් අත්දැකීම් ලබා දීමට උපදේශකයින්ට සහාය වීම සඳහා පුළුල් මෙවලමක් ලෙස ක්‍රියා කරයි. උපදේශක මාර්ගෝපදේශය, පාඨමාලා ඉදිරිපත් කිරීම සඳහා පැහැදිලි මාර්ග සිතියමක් ලබා දීමෙන් ව්‍යුහගත ඉගෙනීමට පහසුකම් සපයන අතර, පුහුණුවේ අනුකූලතාව සහතික කරයි. ඵලදායී ඉගැන්වීමේ උපාය මාර්ගවලින් උපදේශකයින් සන්නද්ධ කිරීමෙන් එය උපදේශක විශ්වාසය වැඩි දියුණු කරයි. අන්තර්ක්‍රියාකාරී සහභාගීත්වයට සහාය වීමෙන්, මාර්ගෝපදේශය සිද්ධි අධ්‍යයන, සාකච්ඡා සහ ප්‍රායෝගික අභ්‍යාස හරහා සහභාගීත්ව ඉගෙනීම දිරිමත් කරයි. එය අභිරුචිකරණයට ඉඩ සලසන අතර, උපදේශකයින්ට විවිධ කර්මාන්ත සන්දර්භයන්ට සහ සහභාගිවන්නන්ගේ පසුබිම්වලට අන්තර්ගතය අනුවර්තනය කිරීමට ඉඩ සලසයි.

### ඉදිරිපත් කිරීමේ විනිවිදක

PowerPoint presentation slides සංකීර්ණ තොරතුරු සරල කිරීමට, ව්‍යුහය සැපයීමට සහ දෘශ්‍ය ඉගෙන ගන්නන් සම්බන්ධ කර ගැනීමට නිර්මාණය කර ඇත. අන්තර්ගතය අර්ථවත් කොටස් වලට කැඩීමෙන් සහ ප්‍රධාන කරුණු අවධාරණය කිරීමෙන්, slides උපදේශකයාට සැසිය පුරා තාර්කික ප්‍රවාහයක් පවත්වා ගැනීමට උපකාරී වේ. හොඳින් ව්‍යුහගත කරන ලද slides හැඳින්වීමකින් ආරම්භ වන අතර, පසුව අන්තර්ගත කොටස් වලින් සමන්විත වන අතර සාරාංශයක් සහ ප්‍රශ්නෝත්තර සමඟ අවසන් වේ.

### ආකෘති, පිරික්සුම් ලැයිස්තු සහ මාධ්‍ය අන්තර්ගතයන්

මීට අමතරව, පාඨමාලා ද්‍රව්‍යවලට ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම නිර්මාණය කිරීම සඳහා පූර්ව සැලසුම් කරන ලද ආකෘති, අවදානම් තක්සේරු කිරීම් සහ ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණයන් සිදු කිරීම සඳහා සැකිලි, හදිසි ප්‍රතිචාර ක්‍රියා පටිපාටි සඳහා පිරික්සුම් ලැයිස්තු, සිදුවීම් විධාන පද්ධති සහ සන්නිවේදන ක්‍රියා පටිපාටි (protocol) ඇතුළත් වේ. මෙම සම්පත් ප්‍රායෝගික අභ්‍යාස සහ ප්‍රායෝගික යෙදුම් සඳහා පහසුකම් සපයන අතර, සහභාගිවන්නන්ට ද්‍රව්‍ය සමඟ සෘජුවම සම්බන්ධ වීමට ඉඩ සලසයි. අවදානම් තක්සේරු සමාකරණ සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සංවර්ධන කාර්යයන් වැනි පුහුණු අවස්ථා සහ ගැටළු විසඳීමේ අභ්‍යාස, ඉගෙනීම ශක්තිමත් කිරීමට උපකාරී වේ. අර්බුද කළමනාකරණ භූමිකා නිරූපණයන් ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය  සංකල්ප පිළිබඳ ප්‍රායෝගික අවබෝධය තවදුරටත් වැඩි දියුණු කරයි.

ප්‍රධාන ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය  ක්‍රියා පටිපාටි සහ සංකල්ප පැහැදිලි කිරීම සඳහා වීඩියෝ සහ බහුමාධ්‍ය අන්තර්ගතයන් ඇතුළත් කර ඇති අතර, සහභාගිවන්නන්ගේ සහභාගීත්වය වැඩි කරයි. අවස්ථා පාදක අභ්‍යාස පාඨමාලාවට ඒකාබද්ධ කර ඇති අතර, අර්බුද කළමනාකරණය පුහුණු කිරීම සඳහා සහභාගිවන්නන්ට ස්ක්‍රිප්ට් සහ අර්ථ දක්වා ඇති භූමිකාවන් ඇතුළත් වේ. මීට අමතරව, සැබෑ ලෝක අර්බුදවලදී සූදානම වැඩි කිරීමට සහ කණ්ඩායම් සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමට මේස පුවරු මත කරන අභ්‍යාස ඇතුළත් කර ඇත. මෙම විවිධ ක්‍රම මගින් සියලුම සහභාගිවන්නන් සඳහා පුළුල් හා ආකර්ශනීය ඉගෙනුම් අත්දැකීමක් සහතික කෙරේ.

### වැඩිදුර කියවීම් සඳහා ද්‍රව්‍ය

ප්‍රධාන ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය සංකල්ප වඩාත් විස්තරාත්මකව ගවේෂණය කිරීමට

සහ ක්ෂේත්‍රයේ හොඳම භාවිතයන් පිළිබඳව යාවත්කාලීනව සිටීමට වැඩිදුර කියවීම සඳහා අමතර ද්‍රව්‍ය නිර්දේශ කරනු ලැබේ. පාඨමාලාව සඳහා ප්‍රධාන යොමු ද්‍රව්‍ය ද සපයනු ලැබේ. ව්‍යාපාර අඛණ්ඩතාවයේ නවතම ප්‍රවණතා සහ වර්ධනයන් අතිරේක කියවීමට ඇතුළත් වේ.

## 7. ඉගෙනුම් ක්‍රියාකාරකම්

සහභාගිවන්නන් කණ්ඩායම් පහකට බෙදන අතර, සෑම කණ්ඩායමකටම අංශ පසෙන් එකකින් උපකල්පිත ව්‍යාපාරයක් පවරනු ලැබේ. භූ භෞතික පරිසරය සහ අදාළ උපද්‍රව අවදානම් සැලකිල්ලට ගනිමින්, සෑම කණ්ඩායමක්ම එක් එක් සැසිය තුළ දක්වා ඇති පියවර හරහා කටයුතු කරනු ඇත. පාඨමාලාව අවසන් වන විට, සෑම කණ්ඩායමක්ම ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සංවර්ධනය කරනු ඇති අතර, එය තීක්ෂ්ණ බුද්ධිය සහ අත්දැකීම් බෙදා ගැනීම සඳහා පූර්ණ සැසියකදී ඉදිරිපත් කර සාකච්ඡා කරනු ලැබේ.

පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු, සහභාගිවන්නන්ට ව්‍යාපාර ක්‍රියාවලීන් සහ අවදානම් සාධක පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙනු ඇති අතර, එමගින් ඔවුන්ට උපාය මාර්ග සංවර්ධනය කිරීමට සහ නිශ්චිත අවදානම් වලට ගැලපෙන ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සකස් කිරීමට හැකි වේ.

## 8. තක්සේරු කිරීම, ඇගයීම සහ සහතික කිරීම

ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය  පුහුණුකරු පුහුණුවේදී සහභාගිවන්නන් අපේක්ෂිත නිපුණතා සහ ඉගෙනුම් අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා තක්සේරුව සහ ඇගයීම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අවබෝධය සහ ලබාගත් දැනුම මැනීම සඳහා, පූර්ව සහ පසු පරීක්ෂණ පවත්වනු ලැබේ. පූර්ව පරීක්ෂණය ඉගෙන ගන්නන්ගේ මූලික දැනුම හඳුනා ගැනීමට උපකාරී වන අතර, පශ්චාත් පරීක්ෂණය මඟින් පාඨමාලාව පුරාවට සහභාගිවන්නන් කොපමණ ප්‍රමාණයක් ඉගෙන ගෙන ඇත්දැයි තක්සේරු කිරීමට ඉඩ සලසයි. ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සංවර්ධනය කිරීම සහ මේස පුවරු මත කරන අභ්‍යාසයක් පැවැත්වීම වැනි ප්‍රායෝගික පැවරුම්, පාඨමාලාව අතරතුර ඉගෙන ගත් සංකල්ප යෙදීමට සහභාගිවන්නන්ට ප්‍රායෝගික අවස්ථා සපයයි. මෙම පැවරුම් සැබෑ ලෝක අවස්ථා වලදී ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය  දැනුමේ ප්‍රායෝගික යෙදුම පරීක්ෂා කරයි. දැනුම දිගු කාලීනව රඳවා තබා ගැනීම තවදුරටත් ඇගයීම සඳහා, පාඨමාලාවෙන් මාස තුනකට පසු පසු විපරම් ප්‍රශ්නාවලියක් පවත්වනු ලැබේ. මෙම ප්‍රශ්නාවලිය සහභාගිවන්නන් ප්‍රධාන සංකල්ප කොතරම් හොඳින් රඳවා ගෙන ඇත් දැයි මනිනු ලබන අතර ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා ඵලදායී ලෙස වැඩ කිරීමේ හැකියාව කෙරෙහි ToT කල් පවතින බලපෑමක් ඇති කරන බව සහතික කරයි.

මෙම තක්සේරු ක්‍රම හරහා, සහභාගිවන්නන් අපේක්ෂිත නිපුණතා ලබා ගැනීම පමණක් නොව, ඔවුන්ගේ සංවිධානවල ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය  භාවිතයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම සහ කුසලතා රඳවා ගන්නා බව සහතික කළ හැකිය.

පාඨමාලාව පූර්ණ කාලීනව සම්පූර්ණ කර, ඉගෙනුම් සැසි සහ ප්‍රායෝගික අභ්‍යාස දෙකෙහිම උපදේශකයින්ගේ කාර්ය සාධන අපේක්ෂාවන් සපුරාලන සහභාගිවන්නන්ට, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ලෝක ආහාර වැඩසටහන සහ ලංකා වාණිජ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්පූර්ණ කිරීමේ සහතිකයක් ලබා ගැනීමට සුදුසුකම් ලැබේ.

## 9. පාඨමාලා කාලසටහන

### ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS)
පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව

........................සිට............ දක්වා............... දී

| වේලාව | සැසිය පහසුකම් සපයන ලද්දේ |
|---|---|
| **01** දිනය | |
| 08:30 | ලියාපදිංචි කිරීම |
| 09:00<br>මිනිත්තු 45 | සමාරම්භක උත්සවය<br><br>• පිළිගැනීමේ සටහන්<br>• වැඩමුළුව පිළිබඳ දළ විශ්ලේෂණය<br>• සහභාගිවන්නන් හැඳින්වීම<br>• සහභාගිවන්නන්ගේ මූලික තක්සේරුව (පූර්ව-පරීක්ෂණය) |
| 09:45<br>මිනිත්තු 45 | මොඩියුලය 1.0 BCMS පුහුණුකරුවන් පුහුණු කිරීම: හැඳින්වීම<br><br>• ව්‍යාපාර අඛණ්ඩතාව පිළිබඳ හැඳින්වීම<br>• ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ පද්ධතියේ BCMS<br>• කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව: අභියෝග සහ හිඩැස් (කණ්ඩායම් අභ්‍යාසය)<br>• BCMS හරහා පෞද්ගලික අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම<br>• BCMS පුහුණුකරු පුහුණු පාඨමාලාව: ඉගෙනුම් අරමුණු |
| 10:30 | උදෑසන තේ සංග්‍රහය |
| 11:00<br>මිනිත්තු 45 | මොඩියුලය 2.0 BCMS; කුමක්ද? සහ ඇයි?<br><br>• BCMS පිළිබඳව (කණ්ඩායම් අභ්‍යාසය)<br>• BCMS ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිලාභ<br>• BCMS හි ඉතිහාසය සහ එහි පරිණාමය දැන ගන්න<br>• BCMS ශ්‍රී ලාංකික සන්දර්භය |
| 11:45<br>මිනිත්තු 45 | මොඩියුලය 3.0 BCMS රාමුව<br><br>• ජාත්‍යන්තර ප්‍රමිතීන්<br>• ප්‍රමිතිකරණය සහ සහතික කිරීම<br>• සැලසුම් කරන්න- ක්‍රියාත්මක කරන්න-පරීක්ෂා කරන්න-වැඩි දියුණු කරන්න (PDCA) චක්‍රය සහ සහතික කිරීමේ ක්‍රියාවලිය<br>• BCMS හි සමානුපාතිකත්වය<br>• ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මෙහි BCMS |
| 12:30 | දිවා ආහාරය |
| 13:30<br>මිනිත්තු 45 | මොඩියුලය 4.0 සංවිධානයේ සන්දර්භය |

| | |
|---|---|
| | • සංවිධානය පිළිබඳ අවබෝධය<br>• උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ අපේක්ෂාවන්<br>• BCMS හි අරමුණ සහ විෂය පථය |
| 14:15<br>මිනිත්තු 45 | අභ්‍යාසය 4.0 සංවිධානයේ සන්දර්භය<br><br>• සංවිධානය පිළිබඳ අවබෝධය<br>• උනන්දුවක් දක්වන පාර්ශ්වයන් අනුරූපණය කර ඔවුන්ගේ අපේක්ෂාවන් ලැයිස්තුගත කරන්න.<br>• BCM හි අරමුණ සහ විෂය පථය තීරණය කරන්න. |
| 15:00 | දහවල් තේ සංග්‍රහය |
| 15:30<br>මිනිත්තු 30 | මොඩියුලය 5.0 නායකත්වය සහ BCM කණ්ඩායම්<br><br>• නායකත්වය සහ කැපවීම<br>• BCM ප්‍රතිපත්තිය<br>• BCM කණ්ඩායම්, භූමිකාවන් සහ වගකීම් |
| 16:00<br>මිනිත්තු 45 | අභ්‍යාසය 5.0 නායකත්වය සහ BCM කණ්ඩායම<br><br>• නායකත්වය සහ නියෝජ්‍ය නායකයා හඳුනා ගන්න<br>• BCM කණ්ඩායම් සහ සාමාජිකයින් නම් කරන්න. |
| 16:45 | සංග්‍රහ කොට දැක්වීම |
| 17:00 | 1 වන දිනය අවසානය |
| **02** දිනය | |
| 08:30 | උදෑසන සමාලෝචනය සහ ආවර්ජනය |
| 09:00<br>මිනිත්තු 45 | මොඩියුලය 6.0 ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය (BIA)<br><br>• තීරණාත්මක ව්‍යාපාරික ක්‍රියාවලිය<br>• බලපෑම් මට්ටම<br>• ප්‍රමුඛතා ක්‍රියාකාරකම්<br>• ප්‍රතිසාධන කාල රාමුව |
| 09:45<br>මිනිත්තු 45 | අභ්‍යාසය 6.0 ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය (BIA)<br><br>• තීරණාත්මක ව්‍යාපාරික ක්‍රියාවලිය හඳුනා ගැනීම<br>• බලපෑම්වල ප්‍රමාණය ඇගයීම<br>• ප්‍රමුඛතා ක්‍රියාකාරකම් තීරණය කිරීම<br>• ප්‍රතිසාධන කාල රාමුවක් සැකසීම |
| 10:30 | උදෑසන තේ සංග්‍රහය |
| 11:45<br>මිනිත්තු 45 | මොඩියුලය 7.1 ව්‍යාපාර ක්‍රියාවලීන්හි උපද්‍රව පරිසරය සහ අවදානම්<br><br>• උපද්‍රව අවබෝධ කර ගැනීම<br>• අනතුරකට භාජනය වියහැකි බව, නිරාවරණය සහ අවදානම<br>• උපද්‍රව සහ අවදානම් තොරතුරු ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රවේශ්‍යතාව<br>• උපද්‍රව සහ අවදානම් තොරතුරු යෙදීම් |

| | |
|---|---|
| 12:30 | දිවා ආහාරය |
| 13:30<br>මිනිත්තු 45 | අභ්‍යාසය 7.0 අවදානම් තක්සේරුව<br><br>• විභව උපද්‍රව සහ ඒවායේ සම්භාවිතාව හඳුනා ගැනීම<br>• අවදානම් මට්ටම ඇගයීම |
| 14:15<br>මිනිත්තු 45 | මොඩියුලය 8.1 ව්‍යාපාර අඛණ්ඩතා උපායමාර්ග සහ විසඳුම්<br><br>• ප්‍රමුඛතා ක්‍රියාකාරකම් ආරක්ෂා කිරීම<br>• ස්ථාවර කිරීම, අඛණ්ඩව පවත්වාගෙන යාම, නැවත ආරම්භ කිරීම සහ ප්‍රතිසාධනය කිරීම<br>• බලපෑම් අවම කිරීම, ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණය කිරීම<br>• උපාය මාර්ග සහ විසඳුම් තෝරා ගැනීම |
| 15:00 | දහවල් තේ සංග්‍රහය (වැඩ කරන අතරතුර) |
| 16:00<br>මිනිත්තු 45 | කණ්ඩායම් ඉදිරිපත් කිරීම; BCP හි සාරාංශය (මිනිත්තු 8/කණ්ඩායම)<br><br>• සංවිධානයේ සන්දර්භය<br>• නායකයා සහ කණ්ඩායම්<br>• ප්‍රමුඛතා ක්‍රියාකාරකම් සහ ප්‍රතිසාධන කාල රාමුව<br>• උපද්‍රව සහ අවදානම්<br>• ව්‍යාපාර අඛණ්ඩතා උපාය මාර්ග සහ විසඳුම් |
| 16:45 | සංග්‍රහ කොට දැක්වීම |
| 17:00 | 2 වන දින අවසානය |
| **03** දිනය | |
| 08:30 | උදෑසන සමාලෝචනය සහ ආවර්ජනය |
| 09:00<br>මිනිත්තු 45 | මොඩියුලය 8.2 සහායක ප්‍රජාවන්; මානුෂීය ප්‍රතිචාරය<br><br>• මානුෂීය මූලධර්ම සහ පෞද්ගලික අංශයේ ප්‍රවේශය<br>• මූලික මානුෂීය ප්‍රමිතීන් (CHS)<br>• මූලද්‍රව්‍ය නවයක සාරය<br>• කැපවීම් 1 - 9<br>• CHS පිරික්සුම් ලැයිස්තුව |
| 09:45<br>මිනිත්තු 45 | මොඩියුලය 9.0 සම්පත් අවශ්‍යතා<br><br>• පුද්ගලයින්, හවුල්කරුවන් සහ සැපයුම් දාමය<br>• තොරතුරු දත්ත සහ ICT පද්ධති<br>• ගොඩනැගිලි, සේවා ස්ථාන, උපකරණ, උපයෝගිතා සහ පරිභෝජන ද්‍රව්‍ය<br>• ප්‍රවාහනය සහ සැපයුම්<br>• ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා මූල්‍යකරණය |
| 10:30 | උදෑසන තේ සංග්‍රහය (වැඩ කරන) |
| 11:00<br>මිනිත්තු 45 | අභ්‍යාසය 9.0 සම්පත් අවශ්‍යතා<br>උපයෝගිතා අවශ්‍යතා හඳුනා ගන්න |
| 12:15 | දිවා ආහාරය |
| 13:15<br>මිනිත්තු 60 | අභ්‍යාසය 10.0 BCM හි ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා අභ්‍යාස |

| | |
|---|---|
| | ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පරීක්ෂා කිරීම සඳහා මේස පුවරු මත සිදු කරන අභ්‍යාසය |
| 14:15<br>මිනිත්තු 45 | කණ්ඩායම් ඉදිරිපත් කිරීම්; අභ්‍යාසයේ ප්‍රතිඵලය (මිනිත්තු 8/කණ්ඩායම)<br><br>• සාකච්ඡා සහ ගනු ලැබූ ප්‍රධාන තීරණ<br>• හොඳින් සිදු වූ දේ සහ හඳුනාගත් හිඩැස්<br>• BCP වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ |
| 15:00 | දහවල් තේ සංග්‍රහය |
| 15.30<br>මිනිත්තු 60 | සමාප්ති සැසිය<br><br>• සම්පිණ්ඩනය කර දැක්වීම<br>• සහභාගිවන්නන් ඇගයීම (පසු පරීක්ෂණය)<br>• සහභාගිවන්නන් විසින් පාඨමාලා තක්සේරුව<br>• සාමූහිකව ගැටලු විසඳීම සඳහා සාකච්ඡා සහ ඉදිරි ගමන<br>• සහතික ප්‍රදානය කිරීමේ උත්සවය<br>• අවසාන කිරීම |
| 16:00 | වැඩසටහනේ අවසාන |

## කර්තෘ මණ්ඩලය

- ඉංජිනේරු බන්දුල වික්‍රමාරච්චි මහතා
- මහාචාර්ය K.D.N වීරසිංහ මහතා
- මනෝරි දිසානායක මහත්මිය
- සමන්ත ද මෙල් මහතා
- හර්ෂනී කරුණාතිලක මහත්මිය